# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2006/45 - 2017 පෙබරවාරි මස 17 වැනි සිකුරාදා - 2017.02.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2016

**2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත**

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වන වගන්තිය සමග කියවිය යුතු 142 වන වගන්තිය යටතේ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

වෛද්‍ය රාජිත සේනාරත්න,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය.

2017 පෙබරවාරි මස 17 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2017 අංක 01 දරන වෛද්‍ය උපකරණ මිල නියම කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කිසිදු නිෂ්පාදකයකු, ආනයනකරුවකු, බෙදාහරින්නකු, වෙළෙන්දකු, ඖෂධවේදියකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු යම් වෛද්‍ය ආයතනයක් හෝ යම් වෛද්‍ය උපකරණ සන්තකයේ දරන්නකු විසින් මෙහි උපලේඛනයේ II වන තීරුවේ වෙළඳ නාමයෙන් හෝ අනුමත නාමයෙන් විස්තර කර දක්වා ඇති යම් වෛද්‍ය උපකරණයක් එහි IV වන තීරුවේ අනුරූපී සටහනේ දක්වා ඇති උපරිම සිල්ලර මිලට (MRP) වඩා වැඩි මිලකට අලෙවි කිරීම, අලෙවි කිරීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ඒ සඳහා අයකිරීම නොකළ යුතු ය.

3. වෙළඳ නාමයෙන් හෝ අනුමත නාමයෙන් මෙහි උපලේඛනයේ විස්තර කර ඇති යම් වෛද්‍ය උපකරණයක් අලෙවි කරන හෝ අලෙවිය සඳහා ඉදිරිපත් කරනු ලබන හෝ ඒ සඳහා අයකරන සෑම තැනැත්තකුම හෝ 2 වන නියෝගයේ දක්වා ඇති ආයතනයක් එම වෛද්‍ය උපකරණයේ වෙළඳ නාමය හෝ අනුමත නාමය සහ මිල පැහැදිලිව දක්වන රිසිට් පතක් නිකුත් කළ යුතු ය.


1A - PG 3417 — 807 (2017/02)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. නිෂ්පාදිත හෝ විකිණීමට තිබෙන වෛද්‍ය උපකරණ තොගයේ අයිතමවල එක් එක් ඒකකයේ මෙහි උපලේඛනයේ දක්වා ඇති අදාළ උපරිම සිල්ලර මිල ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් එසේවුව ද මෙම නියෝග පළකරන ලද දිනයේ සිට දින හතළිස් පහක කාල සීමාවක් ඉකුත් වීමට පෙර අදාළ වෙළඳ ඇසුරුමේ හෝ ලේබලයේ මුද්‍රණය හෝ සළකුණු කළ යුතු ය.

5. මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් නිෂ්පාදකයකු, ආනයනකරුවකු, බෙදාහරින්නකු, වෙළෙන්දකු, ඖෂධවේදියකු හෝ පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු යම් වෛද්‍ය ආයතනයක් හෝ යම් වෛද්‍ය උපකරණ සන්තකයේ දරන තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ **IV** වන කොටස යටතේ ඔහුට එරෙහිව නඩු පැවරිය යුතු ය.

6. මෙහි උපලේඛනයේ දක්වා ඇති වෛද්‍ය උපකරණවල උපරිම සිල්ලර මිල සෑම සිල්ලර අලෙවිසැලකම ප්‍රදර්ශනය කිරීම සෑම නිෂ්පාදකයකු, බෙදාහරින්නකු, වෙළෙන්දකු, ආනයනකරුවකු, ඖෂධවේදියකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු යම් වෛද්‍ය ආයතනයක් සහ යම් වෛද්‍ය උපකරණ සන්තකයේ දරන්නකුගේ වගකීම විය යුතු ය.

7. "පෞද්ගලික වෛද්‍ය ආයතනය" යන්නට 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

### *උපලේඛනය*

අක්ෂි කාච/ඩිලිවරි සිස්ටම් සමග අක්ෂි කාච (ප්‍රිලෝඩඩ්/කාට්‍රිජය සහිත)

| *I වැනි තීරුව* | *II වැනි තීරුව වෙළඳ නාමය/ අනුමත නාමය* | *III වැනි තීරුව නිෂ්පාදකයා* | *IV වැනි තීරුව උපරිම සිල්ලර මිල (MRF)(ශ්‍රී ලංකා රුපියල්)* |
|---|---|---|---|
| 1. | ඇක්‍රිස(ර්)ෆ් ප්‍රිලෝඩඩ් ඩිලිවරි සිස්ටම් | ඇල්කෝන් | 17,000.00 |
| 2. | ඇක්‍රිසෝෆ් IQ SN60WF කාට්‍රිජය සහිත | ඇල්කෝන් | 16,400.00 |
| 3. | ටෙක්නිස් 1 පීස් | ඇබෝට් මෙඩිකල් | 16,200.00 |
| 4. | එන් විස්ටා | බෝෂ් ඇන්ඩ් ලෝම්බ් | 15,500.00 |
| 5. | ටෙක්නිස් මොනොෆොකල් | ඇබෝට් මෙඩිකල් | 15,500.00 |
| 6. | හෝයා අයිස(ර්)ට් 251 | හෝයා | 12,100.00 |
| 7. | නයිඩෙක් නෙක්ස්-ලෝඩ් සිස්ටම් SP SZ-1 | නයිඩෙක් | 11,750.00 |
| 8. | ඇක්වා සෙන්ස් ආරිස් | ආරෙන් සයන්ටිෆික් | 9,800.00 |
| 9. | බයි-ෆ්ලෙක්ස් HB (877FABY ස්ටෑන්ඩඩ් අයි ඕ එල්) | මෙඩිකොන්ට්‍යු(ර්) | 8,900.00 |
| 10. | බනි HP | හනිටා මාකටින් | 8,700.00 |
| 11. | අයි - ස්ට්‍රීම් ප්‍රීලෝඩඩ් | MD ටෙක් | 7,100.00 |
| 12. | ඕරොවිව් EV | ඕරොලැබ් | 4,950.00 |
| 13. | ඇක්‍රිසෝෆ් SP SA 60 AT කාට්‍රිජය සහිත | ඇල්කෝන් | 13,100.00 |
| 14. | ඇක්‍රිසෝෆ් එක්ස්පෑන්ඩ් MA 60 MA කාට්‍රිජය සහිත | ඇල්කෝන් | 13,100.00 |
| 15. | සෙන්සර් 1 පීස් | ඇබෝට් මෙඩිකල් | 12,800.00 |
| 16. | සෙන්සර් | ඇබෝට් මෙඩිකල් | 11,750.00 |
| 17. | ඇක්‍රිසෝෆ් MP MA 60 AC | ඇල්කෝන් | 11,150.00 |
| 18. | හෝයා PY 60R | හෝයා | 7,900.00 |
| 19. | ඇක්‍රිවා UD (බ්ලූ ෆිල්ටර්) | VSY බයෝටෙක් | 6,900.00 |
| 20. | සුප්‍රා ෆෝබි ප්‍රීලෝඩඩ් සිස්ටම් | අප්පසාමි | 6,500.00 |
| 21. | ඇක්‍රිවා UD | VSY බයෝටෙක් | 6,500.00 |
| 22. | ඇක්‍රිඔස් - MI 60 | බෝෂ් ඇන්ඩ් ලෝම්බ් | 14,800.00 |
| 23. | ඇක්‍රිඔස් AO | බෝෂ් ඇන්ඩ් ලෝම්බ් | 11,600.00 |
| 24. | ඇක්‍රිඔස් ඇඩප්ට් | බෝෂ් ඇන්ඩ් ලෝම්බ් | 10,850.00 |
| 25. | බනි AFM | හනිටා මාකටින් | 10,600.00 |
| 26. | CT ඇස්ෆිනා 404 | කාල් සීස් මෙඩිටෙක් | 10,500.00 |
| 27. | CT ස්ෆෙරිස් 204 | කාල් සීස් මෙඩිටෙක් | 8,200.00 |

*සම්බන්ධිතයි*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව වෙළඳ නාමය/ අනුමත නාමය* | *III වැනි තීරුව නිෂ්පාදකයා* | *IV වැනි තීරුව උපරිම සිල්ලර මිළ (MRF)(ශ්‍රී ලංකා රුපියල්)* |
|---|---|---|---|
| 28. | බනි AF | හනිටා මාකටින් | 7,200.00 |
| 29. | C-ෆ්ලෙක්ස් ඇස්ෆෙරික් 970 C/920 H | රේන(ර්) | 6,000.00 |
| 30. | ඇස්පිරා - aAY | හ්‍යුමන් ඔප්ටික්ස් | 5,700.00 |
| 31. | ඔක්‍යුවා | VSY බයෝටෙක් | 4,000.00 |
| 32. | ඕරොෆ්ලෙක්ස් | ඕරොලැබ් | 1,800.00 |
| 33. | සීලෙන්ස් | හනිටා මාකටින් | 6,200.00 |
| 34. | C-ෆ්ලෙක්ස් IOL (ස්ෆෙරිකල් 570 C) | රේන(ර්) | 5,100.00 |
| 35. | ඇස්පිරා AS | හ්‍යුමන් ඔප්ටික්ස් | 5,200.00 |
| 36. | ටෙක්සොෆ්ට් ටෙට්‍රා | ෆ්‍රෙඩ් හොලොව්ස් | 4,800.00 |
| 37. | ටෙක්සොෆ්ට් ෆ්ලෙක්ස් | ෆ්‍රෙඩ් හොලොව්ස් | 4,500.00 |
| 38. | ඇක්‍රිෆෝල්ඩ් | අප්පසාමි | 3,000.00 |

03 - 162